චක්‍රලේඛ අංකය: 03/2014

මගේ අංකය / எனது இல. / My No. RG/MBD/1/2012

ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. 2889488, 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491

ඊමේල් / மின்னஞ்சல் / Email info@rgd.gov.lk, rg@rgd.gov.lk

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகத் திணைக்களம்
REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site: www.rgd.gov.lk

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

234/A3,
டென்சில் கொப்பேகடுவ மாவத்தை,
பத்தரமுல்லை.

234/A3,
Denzil Kobbakaduwa Mawatha,
Battaramulla.


දිනය / திகதி / Date: 2014/02/ 18

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්/දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්,
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

## උප්පැන්න ලේඛනවල නම් වෙනස් කිරීම සහ අළුතින් නම් ඇතුළත් කිරීම

උක්ත කරුණට අදාලව 1998/01/01 දිනැතිව මවිසින් නිකුත්කර ඇති අංක එම්36/වීවධ/04/96 දරණ චක්‍රලේඛයට අමතර වශයෙනි.

02. ඇතැම් පුද්ගලයන් අන් අයගේ අයිතිවාසිකම්වලට හානිකර බලපෑමක් ඇතිකරමින් තමාට වැඩි වරප්‍රසාද හා හිමිකම් ලබා ගැනීමේ පෞද්ගලික අපේක්ෂාවෙන් තම උප්පැන්න ලේඛනයේ සඳහන් නම වෙනස් කිරීමට පෙළඹී සිටින බව මා වෙත වාර්තාවී ඇත. මැතිවරණ කොමසාරිස් විසින් මා වෙත එවා ඇති "අ අ අ අ . . . . . . . .   . . . . " යනුවෙන් නම සංශෝධනය කර නිකුත් කරන ලද උප්පැන්න සහතිකයකින් ඒ බව තවදුරටත් සනාථවී ඇත.

03. උච්චාරණය කළ නොහැකි, ශබ්ද නගා නාමයක් වශයෙන් ව්‍යවහාර කළ නොහැකි අකුරු කිපයක් සංශෝධන හැටියට නම සමග සටහන් කරවා ගැනීමට උප්පැන්න මරණ පනතේ 27 වගන්තිය යටතේ ඉල්ලුම් කර ඇති විට, එම ඉල්ලීම් මුල් අවස්ථාවේදීම ප්‍රතික්ෂේප කල යුතුය.

04. වයස අවුරුදු 07ට අඩු දරුවකුගේ නමක් වෙනස් කිරීමට/අළුතෙන් ඇතුළත් කිරීමට ඉල්ලීම් ඉදිරිපත් වන විටදී දෙමාපියන්ගේ ඉල්ලීම සමග දිවුරුම් ප්‍රකාශයක් පමණක් ප්‍රමාණවත් වේ. වයස අවුරුදු 07ත් 21ත් අතර දරුවකුගේ නමක් වෙනස් කිරීමට ඉල්ලීම් ඉදිරිපත් වන විටදී ඉල්ලුම්කරුගේ දිවුරුම් ප්‍රකාශයක් සමග ග්‍රාම නිලධාරී මහතාගේ නිර්දේශයක්ද ලබා ගැනිමට කටයුතු කළයුතු අතර, යෝජිත නම භාවිතා කර ඇති බවට පිළිගතහැකි ලිඛිත සාක්ෂි ලේඛනද ලබා ගත යුතුය.

05. වයස අවුරුදු 21ට වැඩි පුද්ගලයකුගේ නමක් වෙනස් කිරීමට ඉල්ලීම් ඉදිරිපත් වන විටදී ඔහුගේ/ඇයගේ දිවුරුම් ප්‍රකාශයක්, පුවත්පත් දැන්වීමක් සහ ග්‍රාම නිලධාරී මහතාගේ නිර්දේශයක්ද සමග අදාල පුද්ගලයා වෙනස්කර ගැනිමට ඉල්ලා සිටින නම වසරකට වඩා වැඩි කාලයක් භාවිතා කර ඇති බවට වෙනත් පිළිගත හැකි සාක්ෂිද ගොනු කර ගැනීම අනිවාර්ය වේ. ඉල්ලීම ඉදිරිපත් කරන පුද්ගලයාගේ වයස වැඩි වන තරමට ඔහුගෙන්/ඇයගෙන් යෝජිත නම භාවිතා කළ බවට සාක්ෂි ලේඛන වැඩි ප්‍රමාණයක් ලබා ගැනීම අවශ්‍ය වේ.

06. නමක් වෙනස්කර ගැනීමට ඉල්ලීමක් ලැබෙන විට, එම ඉල්ලීමට හේතුව හා ඉල්ලුම්කරුගේ අනන්‍යතාවයද තහවුරු කර ගැනීම අනිවාර්ය වේ. යෝජිත නම භාවිතා කර ඇති බවට ඉදිරිපත් කරන ලිඛිත සාක්ෂි ලේඛනවල නිර්ව්‍යාජ භාවය පිළිබඳවද සොයා බැලිය යුතුය. ඉල්ලුම්කරු නම වෙනස් කරන්නේ ජාතිය වසන් කිරීමේ අදහසින් හෝ වෙනත් වංචනික හේතු සඳහා බවට නිරීක්ෂණය වේ නම්, සැබෑම හේතුව අනාවරණය කර ගැනීම සඳහා සම්පූර්ණ පරීක්ෂණයක් පැවැත්විය යුතුය. එවැනි අවස්ථාවල නම වෙනස්කර භාවිතා කළ බවට ලියවිලිවලින් සමණක් සැනීමට සත් නොවී ඉල්ලුම්කරු පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී, ඔහුගේ/ඇයගේ දෙමාපියන් සහ වෙනත් අදාල කර ගත හැකි සාක්ෂිකරුවන්ද ගෙන්වා ප්‍රකාශ සටහන් කර ගත යුතුය. එමගින් ඉල්ලුම්කරු නම වෙනස් කරන්නේ ජාතිය වසන් කිරීමේ අදහසින් හෝ වෙනත් වංචනික හේතු සඳහා නොවන බවට සනාථ වන්නේ නම් පමණක් එවැනි ඉල්ලීම්වලට අනුමැතිය ලබා දිය හැක. ඉදිරිපත් කර තිබෙන කරුණු ගැන යම් සැකයක් තිබේනම්, ප්‍රකාශය අනුමත කර ප්‍රමාද දෝෂයක් ඇතිවීමට ඉඩ හරිනවාට වඩා, ප්‍රකාශය අනුමත කිරීම ප්‍රතික්ෂේප කිරීම උචිතය.

07. මීට අදාල කටයුතු කිරීම පිළිබඳව දෙපාර්තමේන්තු අත්පොතේ iii වැනි කාණ්ඩයේ vii වැනි පරිච්ඡේදයේ 2 වන කොටස් **උප්පැන්න සහතිකයක නමක් වෙනස් කිරීම සහ අලුතින් නමක් ඇතුළත් කිරීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍ර ගැන පරීක්ෂණ පැවැත්වීම** යන මැයෙන් වන උපදෙස් තරයේ අනුගමනය කිරීමට කටයුතු කරන්න. මෙම උපදෙස්, චක්‍රලේඛ සහ දෙපාර්තමේන්තු නියෝග උල්ලංඝනය වන පරිදි උප්පැන්න ලේඛනවල සංශෝධන සිදුකිරීම කූට ලේඛන සකස් කිරීමක් ලෙස සලකා විනය ක්‍රියාමාර්ග සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටද සිදු වන බවද කාරුණිකව අවධාරණය කරමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්

ඊ. එම්. ගුණසේ
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්

1. ලේකම් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. මැතිවරණ කොමසාරිස් - ඔබේ අංක PCE/2014/02 හා 2014/01/31 දිනැති ලිපිය අනුව දැ.ගැ.ස.
3. කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - අ.ක.ස.
4. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් - දැ.ගැ.ස.
5. සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් - දැ.ගැ.ස.